## - ප්‍ර ස් තා ව නා ව -

ශ්‍රී ලංකාවේ නාගරික මධ්‍යස්ථානයන් ගෙන් නාගරික ජනතාවට මෙන් ම ගැමි ජනතාවටත් සිදුවන සේවය වැදගත් ස්ථානයක් ගනී. ග්‍රාමීය ජනතාවගේ භාණ්ඩ හා සේවා නිෂ්පාදන අලෙවි කිරී+මත් එම ජනතාවට අවශ්‍ය සේවා හා භාණ්ඩ මිල දී ගැනීමත් නගරය කේන්ද්‍ර කොට ගෙන සිදු වේ. එමෙන් ම නාගරික ජනතාවට අවශ්‍ය භාණ්ඩ හා සේවා පහසුකම් සපයාදීමත් නගරයෙන් සිදුවන වැදගත් කාර්යයක් වේ.

ඌණ සංවර්ධිත රටවල මෙන් ම සංවර්ධිත රටවල ද අක්‍රමවත් නාගරික වර්ධනය නිසා, විවිධ නාගරික ගැටළු උද්ගත වී තිබේ. එහෙයින් භූගෝල විද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ නාගරික භූගෝල විද්‍යාව වැදගත් ස්ථානයක් හිමි කර ගනී. නාගරික භූගෝල විද්‍යාඥයන් බොහෝ දෙනකුගේ අවධානය යොමු වූ විෂය ක්ෂේත්‍රයක් ලෙස "නාගරික නේවාසික ව්‍යුහය" හැඳින්විය හැකිය. නමුත් මේ සම්බන්ධයෙන් ඌණ සංවර්ධිත රටවල කර ඇති පර්යේෂණ ඉතා අල්පය. විශේෂයෙන් ම ශ්‍රී ලංකාව වැනි රටවල නාගරික නේවාසික රටාවන්හි වැදගත්කම පිළිබඳ පර්යේෂණ ක්ෂේත්‍රය තවමත් විවෘතව ඇත්තේය.

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ලබන අවධියේ දී නාගරික භූගෝල විද්‍යාව පිළිබඳ දේශනවලදී මෙම පර්යේෂණ තේමාව මගේ සිත්හි තැන්පත් කළ, එමෙන් ම පසු කාලීනව මෙම පර්යේෂණ නිබන්ධය පිළියෙළ කිරීමේදී අනගි උපදෙස් රැසක් ලබාදුන් කොළඹ විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ වර්තමාන අංශ ප්‍රධාන මහාචාර්ය කුසුමා ගුණවර්ධන මෙනවියටත්, නිබන්ධනයේ අඩුලුහුඬුකම් පෙන්වා දෙමින්, මා ධෛර්යමත් කරමින් නිබන්ධන උපදෙස් සැපයූ මහාචාර්ය චාල්ට් රණසිංහ මහත්මියටත් මගේ ස්තූතිය හිමිවේ. මෙම කෘතිය සම්පාදනය කිරීමේදී අවශ්‍ය ධෛර්ය, උපදෙස් හා පහසුකම් සළසාදුන් රුහුණ විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන මහාචාර්ය කාන්ති රත්නායක මහත්මිය ද කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

පර්යේෂණයට අදාළ සියළු ම දත්ත පරිගණකයක ආධාරයෙන් විශ්ලේෂණය කෙරිණ. ඒ සඳහා පහසුකම් සළසාදුන් රුහුණු විශ්වවිද්‍යාලයේ සත්ව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය යේන ද සිල්වා මහතාටත්, පරිගණක දත්ත විශ්ලේෂණයේදී උපදෙස් දෙමින් සහාය වූ එම අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩබ්.කේ.ඩී.සේනාරත්න මහතාටත් විශේෂ ස්තූතිය හිමිවේ.

මූලික දත්ත රැස් කිරීමේදීත් එම දත්ත වගුගත කිරීමේදීත් පරිගණක ගත කිරීමේදීත් නත් අයුරින් උදව් දුන් සියළුම රුහුණු විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළු මොහාන් මල්ලීටත්, සිතියම් සම්පාදනයේදීත් පර්යේෂණයේ සියළුම වැඩ කටයුතු වලදීත් මා සෙවනැල්ල මෙන් පිටුපසින් සිට අවශ්‍ය ශක්තිය හා ධෛර්යදුන් මා දයාබර බිරිඳ ප්‍රියන්තිටත් මගේ අවංක ස්තූතිය හිමි වේ.

පර්යේෂණ නිබන්ධනය සම්පාදනය කිරීමේදී ප්‍රයෝජනවත් සංඛ්‍යා ලේඛන සපයාදුන් සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමාටත්, මාතර නගරාධිපතිතුමාටත්, කෙටි කාලයක් ඇතුළත යතුරුලියනය කළ කල්‍යාණි විතානගේ මහත්මියටත්, අතිපිටපත් සුපරීක්ෂාකාරීව කියවා එය සකස් කර දුන් රුහුණු විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ මහාචාර්ය වීනී විතාරණ මහතා සහ එම අධ්‍යයනාංශයේ කථිකාචාර්ය කෝ. ආනන්ද හිමියන්ටත් කෙටි කාලයක් ඇතුළත ඉතාමත් කලාත්මකව මෙය නිම කර දුන් ඒ.එල්. ජයසිරි මහතාටත් නිබන්ධනය සකස් කිරීමේදී නත් අයුරින් උදව් කළ සියළුම අයට මගේ අවංක ස්තූතිය හිමි වේ.

ඒ.ඩී.ගුණදාස